# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,219—1964 නොවැම්බර් 10 වැනි අඟහරුවාද—1964.11.10**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1961 වර්ෂයේ නොවැම්බර් මාසයේ 10 වෙනි දින අංක 12,772 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද මීගමුවේ, මී/හරිස්චන්ද්‍ර විද්‍යාලයයේ සියලුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට, මීගමුවේ පාඨශාලා පරීක්‍ෂක තැන්පත් පිහනගේ ඩේවිඩ් පෙරේරා මහතාට මෙයින් බලය පවරමි.

2. එකී පිහනගේ ඩේවිඩ් පෙරේරා මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැළැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකිද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්‍ෂ.

(සාපාඩඅ/304)
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1964 ඔක්තෝබර් 20 වෙනි දින දී ය.

11-360/1

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

මීගමුවේ පාඨශාලා පරීක්‍ෂක තැන්පත් පිහනගේ ඩේවිඩ් පෙරේරා වන මම, 1961 වර්ෂයේ නොවැම්බර් මාසයේ 10 වෙනි දින අංක 12,772 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ; 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද මීගමුවේ, මී/හරිස්චන්ද්‍ර විද්‍යාලයට අයත් දේපල 1964 වර්ෂයේ නොවැම්බර් මාසයේ 23 වෙනි සඳුදා පෙරවරු 8.30 ට, එකී, මී/හරිස්චන්ද්‍ර විද්‍යාලයේ දී රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට අදහස් කරන බව, එම පාසලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියලුදෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

පී. ඩී. පෙරේරා,
පාඨශාලා පරීක්ෂක.

1964. 10. 26 වෙනි දින,
මීගමුවේ දී ය.

11-360/2

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1962 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 8 වෙනි දින අංක 13,296 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි සහ 1963 වර්ෂයේ මැයි මාසයේ 10 වැනි දින අංක 13,632 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගවලින් රජයට පවරා ගන්නා ලද පැපිලියවල, කො/පල්ලෙගම සිරි සිදුහත් විද්‍යාලයයේ සියලුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට, දොම්පෙ මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක තැන්පත් දොන් ඇලෝෂියස් මීගොඩ මහතාට මෙයින් බලය පවරමි.

2. එකී දොන් ඇලෝෂියස් මීගොඩ මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැලක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකිද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

(සාපාඩඅ/830)
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1964 ඔක්තෝබර් 20 වෙනි දින දී ය.

11-360/3

1371—ආර් 1938—5,560 (64/11)

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

දෙම්පෙ මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක තැන්පත් දෙන් ඇලෝෂියස් මීගොඩ වන මම, 1962 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 8 වෙනි දින අංක 13,296 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි සහ 1963 වර්ෂයේ මැයි මාසයේ 10 වෙනි දින අංක 13,632 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ; 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද පැපිලියවල, කො/පල්ලේගම, සිරිසිදුහත් විද්‍යාලයට අයත් දේපල 1964 වර්ෂයේ නොවැම්බර් මාසයේ 25 වෙනි බුද දින පෙරවරු 9.30 ට, එකී කො/පල්ලෙගම, සිරිසිදුහත් විදුහලේදී රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට අදහස් කරන බව, එම පාසලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියලුදෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

ඩී. ඒ. මීගොඩ,
පාඨශාලා පරීක්ෂක.

1964.10.26 වෙනි දින,
දොම්පෙ දී ය.

11-360/4

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1963 වර්ෂයේ ජූලි මාසයේ 24 වෙනි දින අංක 13,705 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද කො/කොටහේනේ යහපත් එඬේරාගේ රෝමානු කතෝලික දෙමළ බාලිකා පාසලේ සියලුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට, මීගමු දෙමළ මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක තැන්පත් නූර් මොහම්මදු ආලිම් සයිබු හජ්ජියාර් මොහමඩ් තහා මහතාට මෙයින් බලය පවරමි.

2. එකී නූර් මොහම්මදු ආලිම් සයිබු හාජ්ජියාර් මොහමඩ් තහා මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැලැක්වීමට හෝ බාධාකිරීමට හෝ විරෝධය දක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකිද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජීඑස්/එන්.එස්.ඒ.එච්/171.
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2.
1964. 11. 6 වෙනි දින දී ය.

11-360/5

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

මීගමු දෙමළ මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක තැන්පත් නූර් මොහම්මදු අලිම් සයිබු හාජ්ජියාර් මොහමඩ් තහා වන මම, 1963 වර්ෂයේ ජූලි මාසයේ 24 වෙනි දින අංක 13,705 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ; 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද කො/කොටහේනේ යහපත් එඬේරාගේ රෝමානු කතෝලික දෙමළ බාලිකා පාසලට අයත් දේපල 1964 වර්ෂයේ නොවැම්බර් මාසයේ 26 වෙනි දින බ්‍රහස්පතින්දා පෙරවරු 9.00 ට, එකී කො/කොටහේන යහපත් එඬේරාගේ රෝමානු කතෝලික දෙමළ බාලිකා පාසැලේ දී රජය සඳහා ද වෙනුවෙන් ද භාර ගැනීමට අදහස් කරන බව, එම පාසලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියලුදෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

එන්. එම්. ඒ. එස්. එච්. එම්. තහා,
පාඨශාලා පරීක්ෂක.

1964 නොවැම්බර් 6 වෙනි දින,
මීගමුවේ දී ය.

11-360/6

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි